# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

**No:** 24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** +94 11 2565304 – 6, 5552746, 5552749, **Fax:** +94 114714460
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org


#

## ඌව පළාත් සභා මැතිවරණය 2014 මැතිවරණ දින පුවත්පත් නිවේදනය අංක 01

2014 සැප් 20. කොළඹ ශ්‍රී ලංකාව :

අද 2014 සැප්තැම්බර් 20 වනදා ඌව පළාත් සභා මැතිවරණයේ ඡන්ද ප්‍රකාශ කිරීම ආරම්භ විය. වසර දෙකක් තිස්සේ අදියර 4 ක් යටතේ පවත්වනු ලැබූ පළාත් සභා සභා මැතිවරණ මාළාවක අවසාන මැතිවරණය මෙයයි. මොණරාගල දිස්ත්‍රික්කයේ ඡන්ද කොට්ඨාශ 3 ක හා බදුල්ල ඡන්ද කොට්ඨාශ 9 ක ඡන්ද මධ්‍යස්ථාන 834 කදී ලියාපදිංචි ඡන්දදායකයින් 942,730 දෙනෙකු ඡන්දය පාවිච්චි කිරීමට නියමිතව ඇත.

**ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතයන්**

ඡන්දය ප්‍රකාශ කිරීම පෙ.ව 7.00ට ආරම්භ විය. ප.ව 1.00 වන විට බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය 50% ක් වූ අතර මධ්‍යාහ්න වන විට මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රකාශිත ඡන්ද ප්‍රතිපලය 45% ක් විය. 2009 වසරේදි පැවති පෙර පළාත් සභා මැතිවරණයේදි මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කයේ ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතයන් පිළිවෙලින් 68.69% හා 70.73% ක් විය.

සිද්ධීන්

2014 සැප් 20 : ඌව පළාත බදුල්ල දිස්ත්‍රික්කය, පස්සර ගෝනගල මහා විද්‍යාලය,ගෝනගල. ඡන්ද මධ්‍යස්ථානය ( මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (මැ.ප්‍ර.නි.ම.) ක්ෂේත්‍ර නිරීක්ෂකයන් වාර්තා කල පරිදි ඡන්ද මධස්ථානය ඉදිරිපිට පාරේ ඡන්ද ලකුණක් වන බුලත් කොළය සංකේතය සහ අංක 18 ඇඳ තිබුණි. මෙම චිත්‍රය එ.ජ.නි.ස මැතිවරණ සංකේතය සහ අපේක්ෂක වඩිවෙල් සුරේෂ් මහතාගේ මනාප අංකය වේ. ඔහු පස්සර ආසනයේ සංවිධායකයා ද වේ. ( ඡායාරූප සාක්ෂි මේ සඳහා පවති.)

2014 සැප් 20: ඌව පළාතේ මොණරාගල දිස්තික්කයේ මොණරාගල හොරොම්බුව කණිෂ්ඨ විද්‍යාලයේ මැ.ප්‍ර.නි.ම ක්ෂේත්‍ර නිරීක්ෂකයන් වාර්තා කළ පරිදි පෙ.ව. 7.00ට පමණ ලියාපදිංචි අංක ND 6622 දරණ බස් රථයක් මඟින් හොරොම්බුව කණිටු විද්‍යාලය ඡන්ද මධ්‍යස්ථානය වෙත ඡන්දදායකයන් ප්‍රවාහනය කොට ඇත. වැඩිදුරටත් මොණරාගල ප්‍රාදේශීය සභාවේ සේවකයන් ප්‍රවාහනය කිරීමට ද මෙම බස් රථය යොදා ගැණුනි. මැ.ප්‍ර.නි.ම නිරීක්ෂකයන් වාර්තා කළ පරිදි එ.ජ.නි.ස මොණරාගල දිස්ත්‍රික් අපේක්ෂක ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතාගේ නම එම බස් රථයේ කැපීපෙණෙන ලෙස ප්‍රදර්ශනය විය. මෙම සිද්ධිය පිළිබඳ විස්තරය එම බස් රථයේ ගමන් කළ මගියෙකු වූ ප්‍රාදේශීය සභාවේ සේවකයකු විසින් ද තහවුරු කරන ලදි.

**2014 සැප් 20: ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය, හපුතලේ ග්ලැනනෝ දෙමළ කණිෂ්ඨ විද්‍යාලයේ ඡන්ද මධ්‍යස්ථානය:** මැ.ප්‍ර.නි.ම ක්ෂේත්‍ර නිරීක්ෂකයන් වාර්තා කළ පරිදි 15 දෙනෙකුගෙන් සමන්විත එජනිස (CWC) ආධාරකරුවන් පිරිසක් ඡන්දදායකයන් හමුවට පැමිණ එ.ජ.නි.ස මැතිවරණ සළකුණ සහ 2,11,12 යන මනාප අංක සළකුණු කොට තිබූ ආදර්ශ ඡන්ද පත්‍රිකාවක් පෙන්වා ඒ අනුව ඔවුන්ගේ ඡන්දය පාවිච්චි කරන ලෙස ඉල්ලා ඇත. වාර්තා වන අන්දමට මෙම සිද්ධිය සිදුවී ඇත්තේ ඡන්ද මධ්‍යස්ථානයේ සිට මීටර් 100 ක් දුරකින් වන අතර මේ සම්බන්ධයෙන් විශේෂ ලෙස කාන්තා ඡන්දදායිකාවන් හට බලපෑම් කිරීමට එම කණ්ඩායම ක්‍රියා කොට ඇත.

**2014 සැප් 20: ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය,මහියංගනය, දෙහිගොල්ල මහා විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානය,** මැ.ප්‍ර.නි.ම ජංගම ඡන්ද නිරීක්ෂකයන් වාර්තා කළ පරිදි නිල් පාට ටී ෂර්ට් ඇඳි පිරිසක් දෙහිගොල්ල ඡන්ද මධ්‍යස්ථානයට මීටර් 500 ක් ඇතුලත පිහිටි අතුරු පාරක දී රස කැවිලි බෙදාහරිමින් සිට ඇත.

**2014 සැප් 20: ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය, බණ්ඩාරවෙල ඡන්ද කොට්ඨාශය, ඡන්ද මධ්‍යස්ථාන අංක 60 සහ 61** මැ.ප්‍ර.නි.ම ක්ෂේත්‍ර නිරීක්ෂකයන් වාර්තා කළ පරිදි පොලිස් නිළධාරීන් දෙදෙනකු විසින් ඡන්ද කාඩ්පත් නොමැතිව පැමිණි ඡන්දදායකයන් ඡන්ද මධ්‍යස්ථානයෙන් ආපසු හරවා යවන ලදි. ඇසින් දුටු අයගේ සාක්ෂි මත පදනම්ව මැ.ප්‍ර.නි.ම ජංගම නිරීක්ෂකයන් ගණනය කළ පරිදි පෙ.ව 11.00 ට පමණ ඡන්දදායකයන් 20 දෙනෙකු පමණ මෙසේ හරවා යවනු ලැබ ඇත.

**2014 සැප් 20 : ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය, යූරි වත්ත දෙමළ විද්‍යාලය, ඡන්ද මධ්‍යස්ථානය** සී.එම්.ඊ.වී මැතිවරණ නිරීක්ෂකයන් වාර්තා කළ පරිදි ප.ව. 1.05 ට පමණ යම් පිරිසක් යූරි වත්ත දෙමළ විද්‍යාල,ඡන්ද මධ්‍යස්ථානය අසල දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පැමිණෙමින් සිටි ඡන්දදායකයන් පිරිසකට එ.ජ.නි.ස. (අංක 18) අපේක්ෂක වඩිවෙල් සුරේෂ් මහතා හට ඡන්දය භාවිතා කරන ලෙස බලපෑම් කර ඇත. ඡන්ද මධ්‍යස්ථානයට මීටර් 50 ක් පමණ නුදුරේදි එය සිදුවී ඇත.

**2014 සැප් 20: ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය, බණ්ඩාරවෙල ඡන්ද කොට්ඨාශය, බණ්ඩාරවෙල පොලිස් ස්ථානය:** බණ්ඩාරවෙල පොලිසියේ නියෝජ්‍ය පොලිස් සථානාධිපති පෙ.ව.10.20ට පමණ නිවේදනයක් නිකුත් කරමින් පවසන ලද්දේ බණ්ඩාරවෙල මහනගර සභාවේ පුරපති චමින්ද විජේසිරි මහතා ඇතුළු පුද්ගලයන් පස්දෙනෙක් පමණ පැමිණ එජාප ආධාරකරුවන් හට සිදුකරන ලද තර්ජනය කිරීම් හා පහරදීම් සම්බන්ධයෙන් පොලීසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවයි.

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ සභික හීන්කෙන්ද මහතා සහ වෙළෙඳ කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයා සහ ඔහුගේ ආධාරකරුවන් (හින්කෙන්ද මහතාගේ පැමිණීමෙන් සුළු වේලාවකට පසු පැමිණ ඇති) පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති අතර ඔවුන් සහ බණ්ඩාරවෙල පුරපතිවරයා හා ඔහුගේ ආධාරකරුවන් අතර බහින් බස් වීමෙන් පසු ආරවුලක් ඇති වී ඇත.

සි.එම්.ඊ.වී ජංගම නිරීක්ෂකවරයා වාර්තා කළ පරිදි එම ආරවුලේ ප්‍රතිපලයක් ලෙස බණ්ඩාරවෙල පුරපතිවරයාට ඇති වූ සීරීම් තුවාල හේතුවෙන් ඔහු දියතලාව රෝහලට ඇතුළත් කොට ඇත. ඉන් අනතුරුව ඔහු බදුල්ල මූලික රෝහල වෙත යවනු ලැබ ඇත.

#